2022.07.13

**ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ ජනතා අපේක්ෂාවන් ඉටු කර රට තුළ වහා සාමය ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය**

රට තුළ නිර්මාණය වී ඇති දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් මේ වන විට රටේ ආරක්ෂාව මෙන් ම මහජන ජීවිත ද දැඩි තර්ජනයකට ලක්ව ඇත. ජන ජීවිත සුරක්ෂා කොට ජනතා ගැටලු විසඳීමෙහිලා නිසි සැලැස්මක් නොමැතිව අත්තනෝමතික වූ බල අරගලයක් තුළින් සිදුවනුයේ තව දුරටත් රට අරාජික වීම යි. එහෙයින් මෙම තීරණාත්මක මොහොතේ ජනතා අපේක්ෂාවන් පිළිබඳ අවධානය යොමු කොට ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය තුළ සියලු පක්ෂ නායකයින් එක්ව පාර්ලිමේන්තුව වහා කැඳවා ජාත්‍යන්තර වශයෙන් දේශයේ ප්‍රතිරූපයට හානියක් නොවන පරිද්දෙන් විධිමත් පාලන තන්ත්‍රයක් ගොඩ නැගීමේ අවශ්‍යතාව අපි නැවත නැවතත් අවධාරණය කරමු.

තව ද මෙම තීරණාත්මක මොහොත තුළ රටේ නීතියට අවනතව නීතියේ ආධිපත්‍යයට ගරු කරමින් සාමකාමීව සිය විරෝධය දැක්වීම හැර මහජන දේපළවලට හානි පමුණුවන කිසිදු ක්‍රියාවක නොයෙදීමට විරෝධතාවයේ නියුතු මහජනතාව ද වගකීමෙන් බුද්ධිමත්ව කටයුතු කළ යුතුය.

එසේ ම රට තුළ පවත්නා සැබෑ වතාවරණය පිළිබඳ දැනුවත් වීම මහජනතාවගේ අයිතියක් වන හෙයින් නිදහස් තොරතුරු වාර්තාකරණයට ඉඩ ලබා දී ජන ජීවිත ආරක්ෂා කරමින් රටේ සාමය පවත්වා ගෙන යාමට කටයුතු කිරීම ආරක්ෂක අංශවල යුතුකම හා වගකීම වන බව අපගේ විශ්වාසයයි.

ඒ වගත් මෙසේ ම,

අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන
මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ
මල්වතු මහාවිහාර පාර්ශ්වයේ මහානායක ස්ථවිර,
මල්වතු මහාවිහාරය, මහනුවර.

අතිපූජ්‍ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී
පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන
මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහානිකායේ
අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ මහානායක ස්ථවිර,
අස්ගිරි මහාවිහාරය, මහනුවර.

අතිපූජ්‍ය දොඩම්පහළ ශ්‍රී චන්ද්‍රසිරි අභිධාන
ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ උත්තරීතර මහානායක ස්ථවිර,
ගෝතම තපෝවනය,
කලපලුවාව, මුල්ලේරියාව,
නව නගරය.

අතිපූජ්‍ය මකුලෑවේ ශ්‍රී විමලාභිධාන
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහානිකායේ මහානායක ස්ථවිර,
මිණිඔළුව විද්‍යාවාස මහපිරිවෙණ,
මීරිගම.